3 වන පිටෙන්

දියුණු රටවල ඇමතිකම් පිරිනමන්නේ, බොහෝ විට, අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීණයන්ට ය. මෙය, ලංකාව වැනි රටවලදී කණපිට හැරවිය යුතුව ඇතැයි මම තරයේ විශ්වාස කරමි. කිසි නීතිඥයෙකු අධිකරණ ඇමති වශයෙන් පත් නොකළ යුතු බව, විජේදාස රාජපක්ෂ ආදර්ශයෙන් පෙන්නා දී තිබීම ඒ විශ්වාසයට පදනම් වෙයි. තමාගේ ප්‍රවීණත්වය අදාළ ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් පිරිනමනවා වෙනුවට, තමාගේ පෞද්ගලික සහ වෘත්තීය අවශ්‍යතා සඳහා අදාළ ඇමති පදවිය අපහරණය කරන බවක්, විවිධ අවස්ථාවල මොහුගෙන් ප්‍රදර්ශනය වී තිබේ. ඇවන්ගාඩ් සමාගමේ අයිතිකරුවාව තමන් නොහඳුන්නේ යැයි මුලින්ම ඔහු බොරු කීවේය. ඊළඟට, ඒ අයිතිකරුවා වෙනුවෙන් ඔහු පාර්ලිමේන්තුවේ පෙනී සිටියේය. එම වරදම කළ තිලක් මාරපන ඇමති තනතුරින් ඉල්ලා අස්විය. දියුණු ප්‍රජාතන්ත්‍රවාදයක තිබිය යුතු ඒ ශිෂ්ඨත්වය විජේදාස රාජපක්ෂට නොතිබීම යහපාලනයේම අවාසනාවක් මිස අන් කවරක්ද?

කෙනෙකු අත්අඩංගුවට පත්වූ වහාම නීතිඥ සහාය ලබා ගැනීමට කෙනෙකුට ඇති අයිතිය අද ශිෂ්ට ලෝකයා පිළිගන්නා මූලික ප්‍රතිපදාවකි. එහෙත් අපේ අධිකරණ ඇමතිවරයා කැසකැවූයේ, පොලිස් අත්අඩංගුවට පත් කෙනෙකුට මුලින් සබ්බුව දීමේ ක්‍රමය රැක ගැනීමටයි. ඊළඟට, තවත් එවැනිම ගොරතර නීතියක් වෙනුවෙන්ද ඔහු පෙනී සිටියේය. ඒ, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතයි. මේ නීතිය ලංකාවේ අවභාවිත වී ඇති තරම කෙතෙක්ද යත්, අභාවයට ගිය සඟරාවකට 2006 දී ලියූ ලිපි දෙකක් පාදක කරගෙන, 2009 දී . එස්. තිස්සනායගම්ව අවුරුදු විස්සකට හිරේට යැවුණි. ත්‍රස්තවාදය අවසන් කොට ඇති තත්වයක් තුළත්, මේ රුදුරු පනත තවදුරටත් පවත්වාගෙන යා යුතු යැයි අපේ අධිකරණ ඇමතිවරයා තවමත් විශ්වාස කරයි.

මීට දශකයකට හෝ දෙකකට පමණ ඉහතදී, ඉංග්‍රීසි පත්තරේක කර්තෘට ලියුම් තීරුවට පී. අලස් නැමැත්තෙකු අදහස් දක්වා තිබුණි. ඒ දිනවල, සමකාමී කාන්තා සම්මේලනයක් කොළඹදී පැවැත්වෙන්ට නියමිත විය. අර ලියුම්කරු ඊට එරෙහිව මෙසේ ලියා තිබුණිඳ

"යම් හෙයකින් මේ සමුළුව පැවැත්වුණොත් එදාට, දැනට ස්ත්‍රී දූෂණයට වැරදිකරුවන් වී සිර දඬුවම් විඳින අපරාධකරුවන් පිරිසක් ලිහා හැර, මේ හම්පඩ බැල්ලියන්ට ඇත්ත රසේ රඟ විඳින්ට සැලැස්විය යුතු බවට මම පොලීසියෙන් ඉල්ලා සිටිමි".

පුවත්පතක මෙවැනි අශිෂ්ට සහ සාපරාධී ලිපියක් පළ කිරීමට එරෙහිව පුවත්පත් මණ්ඩලයට පැමිණිල්ලක් ලැබුණි. එම මණ්ඩලයේ සභාපති වුණේ, විජේදාස රාජපක්ෂයි. ඔහු විත්තිය නිදහස් කෙළේය. පැමිණිල්ලට තරයේ අවවාද කෙළේය. ඒ සඳහා ඔහු පාදක කර ගත් ප්‍රධාන තර්ක දෙකක් මෙසේ ය

1. කාන්තා සමලිංගිකත්වය අස්වාභාවික, වනචර ක්‍රියාවකි.

2. නීතියේ පිළිසරණ පතා එන ඕනෑම පැමිණිලිකරුවෙක්, මුලින්ම තමන්ගේ අත් පිරිසුදු කරගෙන පැමිණිය යුතුය.

ඒ සා අශිෂ්ට ලිපියක් සහ මාධ්‍ය භාවිතයක්, ඉහත කී කුතර්ක සේවනයෙන් වික්ටෝරියානු සදාචාරයක් මත පිහිටා එදා ආරක්ෂා කළ විජයදාස රාජපක්ෂ, අද මාධ්‍ය සදාචාරයක් ආරක්ෂා කරන මුවාවෙන් පුද්ගල කෝන්තර පිරිමසා ගැනීමට බැලීම වංචනික ය. කුහක ය.

මේ යහපාලන ආණ්ඩුව 2020 වන තෙක් පෙරලා දැමීමේ හැකියාවක් මහින්ද රාජපක්ෂට නැත. එහෙත් යහපාලනය තුළම ලියලන විෂබීජවලින්

# ජයමේරි සිල්වෙස්ටර් - ලීලාවතී පෙරේරා අනුස්මරණ කුසලානය

ජයමේරි සිල්වෙස්ටර් - ලීලාවතී පෙරේරා අනුස්මරණ කුසලානය වෙනුවෙන් වාර්ෂිකව පැවැත්වෙන ක්‍රිකට් තරගය නොවැම්බර් 27 වන දින වික්ටෝරියාවේ එපින් හිදී සාර්ථකව පැවැත්වුණි.

මෙවර අවිවාහක පිල ජය ගත් අතර, තරගයේ වීරයා කුසලානය තරග කුසලානය ජය ගත් රවිඳු ලියනගේ ගේ සොහොයුරැ පවිදු ලියනගේ ලබා ගැනීම විශේෂත්වයකි.

මේ එම අවස්ථාවේ සේයා රූ කීපයකි







## සන්නස Cartoon





සන්නස
මංගල යෝජනා

මුල් වචන 40 සඳහා
මාසයකට අයකිරීම ඩොලර් 30

පහත දැක්වෙන ගිණුමට මුදල් බැර කර
එම ලදු පත සමග
ඔබේ දැන්වීම අපට එවන්න

Account Name - Sannasa Media
Bank - Westpac
BSB Number - 033 341
Account Number - 590847

